# බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය

මෙය එක් ලිපියකින් සාකච්ඡා කළ හැකි මාතෘකාවක් නොවේ. සමස්තයක් ලෙස ගත් කල මා ලියන බොහෝ ලිපිවලින් කීමට අදහස් කරන්නේ ද බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය ගැනය. ප්‍රංශයේ හෝ වෙනත් රටක හෝ සිටින ඇංකර හා පඬි මැක්කන් ට තේරුම් ගත නොහැකි වුව ද ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය ඒ ලිපිවල අන්තර්ගතය හා සම්බන්ධ වෙයි. එබැවින් ඒ ලිපිවල ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය ගැන ද සඳහන් වෙයි. විශේෂයෙන්ම මෙරට හා පිටරට වාසය කරන දේශප්‍රේමී සිංහල කතෝලික හා වෙනත් ක්‍රිස්තියානි බැතිමතුන් ඉලක්ක කරගෙන ලියැවෙන මේ ලිපියෙන් ප්‍රශ්නය සෘජුවම සාකච්ඡා කෙරෙයි.

අප දැන් වසර ගණනාවක සිට චින්තනය යන සංකල්පය යොදා ගන්නේ සිතීම යන පදයට සමානාර්ථයක් ගෙන දෙන පදයක් ලෙස සලකමින් නොවේ. එහෙත් ඇතැම් ඇංකරයන් තවමත් ඒ බව අවබෝධ කර ගෙන නොතිබීමෙන් පෙන්නුම් කරන්නේ ඔවුන්ගේ ඇංකරත්වයේ තරමය. මේ ඇංකරයෝ සුසමාදර්ශය හෙවත් පැරඩයිමය යන්න දන්නා බවක් අඟවති. එහෙත් ඔවුන් බටහිර විද්‍යාව පිළිබඳ දාර්ශනිකයකු වූ ඇමරිකන් ජාතික තෝමස් කුන් මහතා නිර්මාණය කළ සුසමාදර්ශය යන්න පවා හරිහැටි තේරුම් ගත් බවක් නොපෙනෙයි. සුසමාදර්ශය යන්න තේරුම් ගත් අයකුට චින්තනය යන්න තේරුම් ගැනීම අපහසු නොවේ. කුන් මහතාට අනුව යම්කිසි දැනුම පද්ධතියක ප්‍රවාද සංකල්ප ආදිය බිහිවන්නේ, එනම් නිර්මාණය කෙරෙන්නේ සුසමාදර්ශයක් තුළය. උදාහරණයකට ගතහොත් බටහිර භෞතික විද්‍යාවෙහි ප්‍රවාද රාශියක් ගොඩ නැගී ඇත්තේ නිව්ටෝනීය සුසමාදර්ශය පදනම් කර ගනිමිනි. නිව්ටෝනීය සුසමාදර්ශය වෙනුවට වෙනත් සුසමාදර්ශයක් හඳුන්වාදෙනු ලැබුයේ අයින්ස්ටයින් විද්වතා විසිනි. එහෙත් බොහෝ ඇංකරයන්ට සුසමාදර්ශය යනු තමන් වැනි අඥබාලයන් ඉදිරියේ තමන්ගේ ඊනියා දැනුවත් බව ප්‍රදර්ශනය කිරීම සඳහා වැමැරිය යුතු වචනයක් පමණකි. මොවුන්ගේ ඇතැමකුට අනුව කොකා කෝලා නවතා පෙප්සි කෝලා පානය කිරීමට පුරුදු වීම ද සුසමා දර්ශී වෙනසකි. (පැරඩයිම් ෂිෆ්ට) ඇංකරයන් හා ඇංකරියන් මහත් උජාරුවෙන් තමන්ට නොතේරෙන පැරඩයිම ෂිෆ්ට ගැන කතා කරනු සම්මන්ත්‍රණවලදී ඇසිය හැකිය.

චින්තනය යනු සුසමා දර්ශයට වඩා ගැඹුරු සංකල්පයකි. සුසමාදර්ශය නොතේරෙන එහෙත් බටහිර සංකල්පවලට පුරුදු වූ අයකුට චින්තනය යන්න සම්ම ජාතියේ තේරුම් ගත හැක්කක් නොවේ. ඔවුන්ට එය "තින්කින්" ය ප්‍රවාද සුසමාදර්ශන මත පදනම් වන ආකාරයට සුසමාදර්ශද චින්තන මත පදනම වෙයි. එක් චින්තනයක් තුළ සුසමා දර්ශ රාශියක් තිබිය හැකිය. ඒ අරුතින් ගත් කල යම් සමාජයක බොහෝ කාලයක් මුළුල්ලේ ම එක් විෂයක නොව විෂය සියල්ලෙහිම හා සාමාන්‍ය ජන ජීවිතයෙහි ද ප්‍රවාද සංකල්ප, ජනප්‍රවාද ආදිය නිර්මාණය වන්නේ චින්තනයක් මත පදනම් වෙමිනි. චින්තනයක් යම් නිශ්චිත කාලයක දී ඇංකරයන් හා ඇංකරියන් හැරුණු කොට මුළු මහත් සමාජය සිසාරා සවිඥානිකව පවතියි. (ඇංකරයන් හා ඇංකරියන් ද අවිඥානිකව කටයුතු කරන්නේ ඒ සමාජයේ චින්තනය තුළය. දරු ප්‍රසූතියකට රෝහලකට ඇතුළු වූ ඇංකරියක් තම වේදනාව ප්‍රංශ බසින් කෑ ගසා ප්‍රකාශ කළේය. වෛද්‍යවරයා එය එතරම් ගණනකට නොගන්නා බව පෙණුනු බැවින් ඇංකරියගේ ස්වාමි පුරුෂයා කලබල වී ඒ පිළිබඳ වෛද්‍යවරයාගෙන් විමසා ඇත. ඇංකරියන් ගැන දත් වෛද්‍යවරයා පවසා ඇත්තේ දරු ප්‍රසූතියට තව වෙලා ඇත යනුවෙනි. ටික වේලාවකින් ඇංකරිය ඉංගිරිසියෙන් තම වේදනාව පැවසුවේළු. එවිට ද ඇංකරියගේ ස්වාමි පුරුෂයා හා වෛද්‍යවරයා අතර කලින් වූ සංවාදය ම කෙරී ඇත. තවත් ටික වේලාවකට පසුව ඇංකරිය බුදු අම්මෝ කියා කෑ ගැසීළු. එවිට වෛද්‍යවරයා දැන් වෙලාව හරි යැයි කියමින් ප්‍රසූතාගාරයට ගියේ යැයි අද්‍යතන ජනප්‍රවාදයෙහි සඳහන් වෙයි)

එකිනෙකට අසම්බන්ධ යැයි ද වෙන් වී පවතින්නේ යැයි ද මතුපිටින් පෙනෙන විෂය එකිනෙක සමඟ බැඳී ඇත්තේ කෙසේද යන්න චින්තනය යන සංකල්පය අවබෝධ කර ගත් පසු දැනගත හැකිය. බැලූ බැල්මට බටහිර ගණිතය හා බටහිර නවකතාව අතර සම්බන්ධයක් නැත. එසේත් නැත්නම් බටහිර රාජ්‍ය ආගමින් වෙන් වී පවතින බවක් පෙනෙයි. එබැවින් බටහිරයෝම මේ රාජ්‍යවලට ඓහික හෙවත් අනාගමික (සෙකියුලර්) යන විශේෂණය පටබඳිති. බටහිර ගණිතය තරමට නැතත් බටහිර නවකතාවද වියුක්තය, පොදු බව (ජෙනරලයිසේෂන්) ආත්ම කර ගෙන ඇත. බටහිර සියලු රාජ්‍ය අවසාන විග්‍රහයෙහි දී යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි වෙයි. බටහිර ගණිතය ද යුදෙව්

© Prof. Nalin De Silva

චින්තනය, එනම් යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වෙයි. මේ චින්තනයේ එක් ලක්ෂණයක් වනුයේ දැනුම ආදිය එකිනෙකට අසම්බන්ධ ගොඩවල්වලට (විවික්ත කුලකවලට) වෙන් කිරීමය. ගණිතය නවකතාවෙන් ද කලාව විද්‍යාවෙන් ද පුද්ගලයා සමාජයෙන් ද වෙන් කෙරෙන්නේ ද ඒ අනුවය. එහෙත් මේ වෙන් කිරීම සිදුවන්නේ එකම චින්තනයක් මත පදනම්ව බැවින් ඒ සියලු දෑ අතර ඇති සම්බන්ධය අපට තේරුම් ගත හැකිය. වෙන් කිරීම ද සිදුවන්නේ යම් චින්තනයක් මත පදනම් වෙමිනි. විශ්ව විද්‍යාලවල බටහිර දේශපාලන විද්‍යාව උගන්වන ඇදුරන් කෙතරම් බෙරිහන් දුන්නද බටහිර රාජ්‍ය අනාගමික නොවන බව අපි දනිමු.

අද බටහිර ආධිපත්‍යයෙහි ඇත්තේ යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි (කෙටියෙන් නම් යුදෙව්) චින්තනයය. මේ යුදෙව් චින්තනය බටහිර සැමදාමත් තිබුණු එකක් නොවේ. පහළොස්වැනි සියවස පමණ වන තෙක් කාලයක් මුළුල්ලෙහි බටහිර ආධිපත්‍යය දැරුවේ සමස්තය මුල් කරගත් කතෝලික චින්තනයය. සමස්තය ඉගෙන ගන්නා හා උගන්වන විශ්වවිද්‍යාල බටහිර පැන නැගුණේ ද කතෝලික චින්තනය පදනම් කර ගනිමිනි. ඉතාලියේ බොලොඤ්ඤා විශ්වවිද්‍යාලය බටහිර ඇති වූ පළමු විශ්වවිද්‍යාලය විය. මේ විශ්ව විද්‍යාලවලට නාලන්දා තක්ෂිලා ආදී ආයතන ගුරු වූවාට සැකයක් නැත. බටහිර මුලින් ඇති වූ විශ්වවිද්‍යාලවල වූයේ ඓන්ද්‍රීය සම්බන්ධයකි. විවිධ පීඨ අතර වූයේ සමස්ත සම්බන්ධයකි. පීඨ යන්නට ඉංගිරිසියෙන් යෙදෙන ෆැකල්ටි යන්නෙහි තේරුම ඉන්ද්‍රියය යන්නය. මිනිසා සමස්ත සත්වයකු ලෙස විවිධ ඉන්ද්‍රීය මාර්ගයෙන්, එහෙත් එකට බැඳුණු, සමස්ත දැනුමක් ලබා ගන්නා ආකාරයට විශ්වවිද්‍යාල ද විවිධ පීඨ මගින් එකට බැඳුණු සමස්ත දැනුමක් ලබා ගත්තේ ය. යුදෙව් චින්තනය තුළ මේ විශ්වවිද්‍යාලවල පීඨ අතර තිබූ සම්බන්ධය නැති විය. අද බටහිර විශ්වවිද්‍යාල නමින් පමණක් විශ්ව විද්‍යාල වෙයි. කතෝලික චින්තනය යුදෙව් චින්තනයට වඩා භාරතීය චින්තනවලට සමීප ය. බ්‍රාහ්මන් හා බැඳුණු සමස්ත බවට සමීප සමස්ත බවක් කතෝලික චින්තනයෙහි ද දැක ගත හැකිය. කතෝලික චින්තනයෙහි ද ත්‍රිකෝටික න්‍යාය වෙයි. ක්‍රිස්තුස් වහන්සේ මගින් ලෝකයට පැමිණි දෙවියන් වහන්සේ යුදෙව් යෙහෝවා දෙවියන් වහන්සේට වඩා අවතාර ලෙස ලෝකයට පැමිණෙන විෂ්ණු දෙවියන්ට සමීපය.

පහළොස්වැනි සියවසේ පමණ සිට ක්‍රමයෙන් යුදෙව් චින්තනය පෙරට පැමිණියේය. මේ පෙරට පැමිණීම බටහිර පුනරුදය ලෙස හැඳින්වෙයි. කලාව කලාව ලෙසද විද්‍යාව විද්‍යාව ලෙසද වෙන් වන්නට පටන් ගත්තේ එතැන් සිටය. ඒ සමග මිනසා සමාජයෙන් ද වෙන් වීමට පටන් ගත්තේය. මිනිසා යන ඒකකයට, එනම් පුද්ගලිකත්වයට සමාජය හා නොබැඳුනු සමාජයෙන් වෙන් වූ විශේෂත්වයක් ලැබෙන්නට විය. මිනිසා එසේත් නැත්නම් පුද්ගලයා යන සමාජයෙන් වෙන් වූ වියුක්ත සංකල්පය ක්‍රමයෙන් සමාජයෙහි තහවුරු වීමට පටන් ගත්තේය. සාමාජයට හා ආණ්ඩුව වැනි සමාජයීය ආයතනවලට එරෙහිව මිනිසාට නැත්නම් පුද්ගලයාට අයිතිවාසිකම් ඇත යන්න සංකල්පය ක්‍රමයෙන් සමාජයෙහි වැඩෙන්නට විය. බටහිර මානව අයිතිවාසිකම් උපත ලැබුයේ ද එවැනි වටාපිටාවකය.

යුරෝපීය චින්තන විප්ලවය දකුණෙන් ඇරඹී කෙමෙන් උතුරට ව්‍යාප්ත විය. ඒ සමග දැනුම් මධ්‍යස්ථානය හා දේශපාලන මධ්‍යස්ථානය ද උතුරට ඇදී ගියේය. ඉතාලියේ ගැලීලියෝලා වෙනුවට එංගලන්තයේ නිව්ටන්ලා පහළ වූහ. ස්පාඤ්ඤ නාවික හමුදාව ෆ්‍රැන්සිස් ඩ්‍රේක්ට පරාජය විය. කැල්වින් ලා ලූතර්ලා පාප් වහන්සේගේ ආධිපත්‍යයට අභියෝග කළහ. කතෝලික චින්තනය හා යුදෙව් චින්තනය අතර සියවස් තුනක පමණ කාලයක් තිස්සේ පැවති අරගලයකින් පසු අවසානයේදී යුදෙව් චින්තනය ජයග්‍රහණය කළේය. රෙපරමාදු ප්‍රතිසංස්කරණය නමින් යුරෝපීය පඬුවන් හඳුන්වන්නේ මේ ජයග්‍රහණයයි. යුදෙව් චින්තනය දහඅටවැනි සියවසේදී බටහිර යුරෝපයේ අධිපතිවාදී චින්තනය බවට පත්විය. කතෝලික චින්තනයෙහි සමස්තය ඩෙකාට් නම් ප්‍රංශ ජාතික ගණිතඥයා හා දාර්ශනිකයා ඉදි කළ තාප්පයෙන් (කාටීසිය තාප්පය) වෙන් කර යුදෙව් චින්තනයට ජයග්‍රහණය ලබා දිණි. දේශපාලන වශයෙන් ගත් කළ එය බටහිර යුරෝපීය රාජ්‍ය ස්වාධීන රාජ්‍ය බවට පත් වීමෙන් පිළිබිඹු කෙරිණි. බටහිරයෝ නූතනත්වයේ ආරම්භය ද රෙපරාමාදු ප්‍රතිසංස්කරණයෙහි දකිති. මෙය වැරදි සංකල්පයකි. බටහිර නූතනත්වයේ ආරම්භය සිදු වූයේ පහළොස්වැනි සියවසේ යුදෙව් චින්තනය පෙරට ඒමත් සමගිනි. ඒ පුනරුදයයි. පුනරුදයෙන් ඇරඹි බටහිර නූතනත්වය රෙපරමාදු ප්‍රතිසංස්කරණයේ දී යුරෝපයෙහි තහවුරු විය. අද පවා බටහිර රජයන්නේ නූතනත්වයයි. පශ්චාත් නූතනත්වය යනු නූතනත්වයෙන් හා යුදෙව් චින්තනයෙන් කැඩීමට බටහිරයන් ගත් අසාර්ථක උත්සාහයක් පමණකි. (ඇතැම් විස්තර විදුසර ලිපි පෙළෙහි දැක්වෙයි)

© Prof. Nalin De Silva

බටහිර පුනරුදය යනු යුරෝපයේ, විශේෂයෙන්ම දකුණු යුරෝපයේ යුදෙව් චින්තනය කල එලි බැසීම හා කතෝලික ත්‍රිකෝටික න්‍යාය අත්හැර ග්‍රීක චින්තනයේ න්‍යාය වූ රූපික ද්විකෝටික න්‍යායට නැවතත් යුරෝපීයයන් යෑමක් විය. එය කතෝලික චින්තනයට එරෙහි ව ඇති වූවක් විය. ඉතාලිය, ස්පාඤ්ඤය හා පෘතුගාලය යන කතෝලික චින්තනය බලවත් ම වූ දකුණු යුරෝපයේ එය පැන නැගීමට මූලික වශයෙන් ම බලපෑවේය අරාබින් හරහා මේ රටවලට ලැබුණු දැනුම යැයි සිතමි. ස්පාඤ්ඤයේ හා පෘතුගාලයේ කොටස් මුස්ලිම් අධිරාජ්‍යයට නතුව තිබුණු බව ද අමතක නොකළ යුතුය. යුරෝපීය යටත්විජිතවාදය පැන නැගුණේ ද මේ නව චින්තනය තුළය. (චින්තනය යනු ආර්ථිකය මෙන් එක් සාධකයක් පමණක් නොවන බව ද මෙහි සියල්ල චින්තනය නම් එක් සාධකයකට ඌනිත කිරීමක් නොමැති බවද අවධාරණය කළ යුතුය) රෙපරමාදු ප්‍රතිසංස්කරණය මගින් සිදු වූයේ යුදෙව් චින්තනය බටහිර යුරෝපයේ අධිපතිවාදී චින්තනය බවට පත්වීමය. පුනරුදය හා රෙපරමාදු ප්‍රතිසංස්කරණය අතරතුර කාලයෙහි කතෝලික චින්තනය හා යුදෙව් චින්තනය අතර වූයේ ආධිපත්‍යය සඳහා කෙරුණු දැඩි අරගලයකි. ඒ කාලයෙහි බොහෝ වැදගත් කාර්යයන් කළ අය දොලොවක ජීවත් වූහ.

අතරමැදි කාලයේ ජීවත් වූ අයිසැක් නිව්ටන් විද්වතා ද දෙලොවක් අතර ජීවත් විය. ඔහු කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයෙහි ත්‍රිත්ව විද්‍යාලයට වී යුදෙව් චින්තනය මත පදනම්ව බටහිර ගණිතය හා භෞතික විද්‍යාව පිළිබඳ ගවේෂණ පවත්වන අතරම බටහිර මධ්‍යකාලීන කතෝලික චින්තනය මත පදනම් ව ඇල්කෙමි නම් රසායන පර්යේෂණවල නිරත වෙමින් ලෝහ රත්රන් බවට පත් කරන ක්‍රම අත්හදා බැලුවේය. නිව්ටන් පඬිවරයාගේ ඒ පක්ෂය ගැන එතරම් කතා බහ නොකරන්නේ යුදෙව් චින්තනයට එය කැළලක වන බැවිනි. බටහිර විද්‍යාවේ ඉතිහාසය ලියන්නෝද යුදෙව් චින්තන ආධිපත්‍ය තුළම වූවෝ වෙති. මෙහිදී කිව යුතු තවත් කරුණක් වෙයි. ඉතිහාසය අනෙක් විෂයන්ගෙන් වෙන් කර ඉතිහාසය නමින් විෂයයක් ඇති කෙරුණේ ද යුදෙව් චින්තනය පෙරට ඒමෙන් පසුවය. අපේ මහාවංශය ඉතිහාස කෘතියක් ද ආදී වශයෙන් ප්‍රශ්න නගන ඇංකරයන් හා ඇංකරියන් තේරුම් නොගන්නා කරුණ නම් මහානාම හිමියන්ගේ ඉතිහාසය වෙනත් දෑ සමග ද බැඳුණු ඉතිහාසයක් බවත් එපමණකින් එහි ඉතිහාසයක් නැතැයි කිව නොහැකි බවත්ය. මහාවංශය ඉතිහාස කෘතියක් නොවේ යැයි කියන මේ ඇංකර් බක පණ්ඩිතයෝ ඒ කටින් ම අනුරාධපුරේ සමාධි පිළිමය කලා කෘතියක් යැයි කියති. මහාවංශයේ ඉතිහාසයක් ඇත්තාසේම සමාධි පිළිම වහන්සේගේත් කලාවක් ඇත. එහෙත් එහි කලාව සමග බැඳුණු තවත් දෑ ද වෙයි. මහාවංශය ඉතිහාස කෘතියක් නොවේ නම් සමාධි පිළිමය කලා කෘතියක් වන්නේ කෙසේදැයි ඇංකරියකවත් අපට කියා දෙන්නේද? කෙසේ වෙතත් ඉතිහාසය අනෙක් විෂයයන්ගෙන් වෙන් කර හැදෑරීම මෙන්ම කලාව, කලාව ලෙස ඇගැයීම් ද ඇරඹුණේ යුදෙව් චින්තනයෙන් පසුව බව චින්තනය තබා සුසමාදර්ශයවත් නොදත් ඇංකරයෝ හා ඇංකරියෝ කෙසේ දනිත්ද? (මතු සම්බන්ධයි. මීළඟ කොටස මේ මාතෘකාවෙන්ම ලබන සතියේ ම පළවේ යැයි මින් අදහස් නොකෙරේ. මේ ලිපිය අනෙක් ලිපිවලින් වෙන් කර එක දිගට පළ කිරීමේ අවශ්‍යතාවයක් මට නැත)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva